# PRIME ENTRY BOOKS (Part-VIII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## උප ලෙජරය

සමාන වර්ගයේ ගනුදෙනු රාශියක් සිදුවන ව්‍යාපාරවල ගැටලු රාශියක් මතු වන නිසා පොදු ලෙජරයට අමතර ව උප ලෙජර් පවත්වා ගත හැකි ය.

උප ලෙජරය තුළ තනි සටහන් පමණක් ඇතුළත් කෙරේ.

උදා : ණයගැති ලෙජරය

## ශේෂ ලැයිස්තුව

උපලෙජරයේ ඇති ගිණුම් තුලනය කිරීමෙන් පිළියෙල කරන ශේෂ ලේඛනයයි.

පොදු ලෙජරය තුළ ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරන අතර, ණයගැතියන් හා ණයහිමියන් සම්බන්ධ ගනුදෙනුවල දී පාලන ගිණුම් උපයෝගී කර ගනී.

ClassWork.LK

# ණයගැති පාලන ගිණුමක ආකෘතිය

ණයගැති පාලන ගිණුම

| හර | රු. | බැර | රු. |
|---|---|---|---|
| 4/1 ශේෂය ඉ/ගෙ | xx | 4/1 ශේෂය ඉ/ගෙ | x |
| මුළු ණයට විකුණුම් | xx | ආපසු එවුම් | xx |
| අහිමි කළ දුන් වට්ටම් | xx | දුන් වට්ටම් | xx |
| ණයගැතියන්ගෙන් අය කළ පොලී | xx | මුදල් | xx |
| චෙක්පත් අගරු වීම් | xx | බොල් ණය | xx |
| ණයගැතියන්ට ආපසු ගෙවීම් | x | ණයගැති ලෙජරයෙන් ණයහිමි ලෙජරයට මාරු කිරීම් (හිලව් කිරීම) | xx |
| ශේෂය ප/ගෙ | | ශේ/ප/ගෙ | xx |
| | xx | | xx |
| ශේෂය ඉ/ගෙ | xx | ශේෂය ඉ/ගෙ | x |

# පොදු ලෙජරයේ පාලන ගිණුම සැකසීමේ දී ද්විත්ව සටහන් ක්‍රමයට ගනුදෙනු සටහන් කිරීම

උදාහරණ :

ණයට විකුණුම් ——— { ණයගැති පාලන ගිණුම් හර / විකුණුම් ගිණුම - බැර

ණයගැති මුදල් ලැබීම ——— { මුදල් පාලන ගිණුම/මුදල් ගිණුම් හර / ණයගැති පාලන ගිණුම - බැර

ClassWork.LK

## පාලන ගිණුම

උප ලෙජරයේ ඇති ණයගැති සහ ණයහිමි ගිණුම් වෙනුවෙන් පොදු ලෙජරය තුළ පවත්වාගෙන යනු ලබන ගිණුම පාලන ගිණුම නම් වේ.

## සැසඳුම් ලේඛනය පිළියෙල කිරීමේ අවශ්‍යතාව


පොදු ලෙජරයේ පාලන ගිණුමේ ශේෂය, උප ලෙජරයේ ඇති ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන විය යුතු ය.

එසේ ශේෂ සමාන නොවන්නේ නම්, ශේෂ සැසඳීම සඳහා සැසඳුම් ලේඛනයක් පිළියෙල කළ යුතු ය.

උදා : ණයගැති ශේෂ සැසඳීමේ ලේඛනය

ClassWork.LK

# සැසඳුම් ලේඛන පිළියෙල කිරීම දක්වා ගිණුම්කරණ ක්‍රියාවලිය




ClassWork.LK

# සාරාංශය

- උප ලෙජරයේ පෞද්ගලික ගිණුම්වල ශේෂ එකතුවෙන් ශේෂ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

- පොදු ලෙජරය තුළ සෑම විටම ද්විත්ව සටහන් ක්‍රමයට ගනුදෙනු හා සිද්ධි වාර්තා කරයි.

- උප ලෙජරය තුළ තනි සටහන් ක්‍රමයට ගනුදෙනු හා සිද්ධි වාර්තා කරයි.

- පොදු ලෙජරය තුළ ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරන බැවින් ශේෂ පිරික්සුමක් පිළියෙල කළ හැකි ය.

- උප ලෙජරය තුළ තනි සටහන් ක්‍රමය අනුගමනය කරන බැවින් ශේෂ ලැයිස්තුවක් පමණක් පිළියෙල කරයි.

- යම් නිශ්චිත දිනකට පොදු ලෙජරයේ ණයහිමි පාලන ගිණුමේ ශේෂය උප ලෙජරයේ ණයහිමි ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන විය යුතුයි.

ClassWork.LK

## අභ්‍යාස

(01) නිම්මිගේ ව්‍යාපාරයේ 2017 අප්‍රේල් මාසයේ ණයහිමියන් සමග කළ ගනුදෙනුවල සාරාංශය පහත දැක්වේ.

| ණය හිමියා | ණයට ගැනුම් | ආපසු යැවුම් | ගෙවූ මුදල් | ලද වට්ටම් |
|---|---|---|---|---|
| දිස්නා | 3000 | 300 | 1800 | 200 |
| නිමේෂිකා | 2000 | 200 | 900 | 100 |
| මහේෂි | 1000 | 100 | 450 | 50 |
| එකතුව | 6000 | 600 | 3150 | 350 |

1) ඉහත ගනුදෙනු මූලික පොත්වල සටහන් කරන්න.

2) ඒවා පොදු ලෙජරයේ හා උපලෙජරයේ අදළ ගිණුම්වල සටහන් කරන්න.

ClassWork.LK

(02) ලක්ෂිතගේ ව්‍යාපාරයේ 2017/03/31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 128 000/- කි. මෙදිනට ණයගැති උපලෙජරයේ ඇති ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 121 000 කි. ගිණුම් විගණනයේ දී පහත දෝෂ අනාවරණය කර ගෙන ඇත.

කුෂාන්ට ණයට විකුණුම් රු. 12 000 ක ඉන්වොයිසිය පොත්වලින් මඟ හැරීම.

ආපසු එවුම් ජර්නලය එකතු කිරීමේ දී රු. 3 000 ක් අඩු වෙන් එකතු කර තිබීම.

මාධවගෙන් ලද රු. 15 000 ක් මුදල් ලැබීම් ජර්නලයේ රු. 1 500 ක් ලෙස වාර්තා කිරීම.

සුමුදුට දුන් වට්ටම් රු. 500 ක් ලෙස මුදල් ලැබීම් ජර්නලයෙ සටහන් කළත්, සුමුදුගේ ගිණුමේ සටහන් නො කිරීම.

චාරුනීගේ ගිණුමේ ශේෂය රු. 4 500 ශේෂ ලැයිස්තුවට ගෙන නැත.

ClassWork.LK

**අවශ්‍ය වන්නේ :**

1) ලක්ෂිතගේ ව්‍යාපාරයේ සිදු වී ඇති වැරදි ආශ්‍රයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වරද | වරද සිදු වී ඇත්තේ පොදු ලෙජරය තුළ ද උප ලෙජරය තුළ ද යන්න | පොදු ලෙජරය තුළ නිවැරදි කළ යුතු ආකාරය (ද්විත්ව සටහන) |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

2) ණයගැති පාලන ගිණුමේ ශේෂය, ශේෂ ලැයිස්තුවේ දැනට පවතින ශේෂය සමග සැසඳීමේ ලේඛනයක් පිළියෙල කරන්න.

ශේෂ සැසඳීමේ ලේඛනය

| | | |
|---|---|---|
| ණයගැති පාලන ගිණුමේ ශේෂය | | |
| (+) | | |
| (-) | | |
| උප ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ පවතින ශේෂය | | 121 000 |

ClassWork.LK

3) ලක්ෂිතගේ ව්‍යාපාරයේ ණයගැති පාලන ගිණුම සංශෝධනය කරන්න

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 128 000 | | |

ClassWork.LK

(04) උප ලෙජරයක් පවත්වා ගැනීමේ අරමුණක් නොවන්නේ මින් කුමක් ද?

පොදු ලෙරජය අනවශ්‍ය තරමට විශාලවීම වැලැක්වීම

වැරදි සිදුවීමට ඇති ඉඩකඩ ප්‍රමාණය අවම කිරීම

ශේෂ පිරික්සුම ඉතා දීර්ඝ වීම වැලැක්වීම

ගිණුම්කරණ කටයුතු කීප දෙනෙකු අතර බෙදාහැර අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම

ගිණුම් තැබීමේ පිරිවැය අවම කිරීම

ClassWork.LK

(05) සඳුනිගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදු වූ පහත ගනුදෙනු සැලකිල්ලට ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ණයගැතියා | 2017/1/1 ශේෂය | මුළු විකුණුම් | ණයට විකුණුම් මුළු විකුණුම්වලින් | ආපසු එවුම් | ලද මුදල | දුන් වට්ටම් |
|---|---|---|---|---|---|---|
| අජේන් | 20 000 | 400 000 | 80% ක් | 30 000 | 90 000 | 10 000 |
| රශිනි | 30 000 | 500 000 | 70% ක් | 40 000 | 180 000 | 20 000 |
| පසිඳු | 40 000 | 600 000 | 50% ක් | 30 000 | 180 000 | 20 000 |
| රවිඳු | (10 000) බැර | 700 000 | 60% ක් | 20 000 | 300 000 | 20 000 |
| එකතුව | 80 000 | 2 200 000 | - | 120 000 | 750 000 | 70 000 |

**අවශ්‍ය වන්නේ :**

1) මුදල් ලැබීම් ජර්නලය, විකුණුම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය

2) පොදු ලෙජරයේ අදාළ ගිණුම්

3) ණයගැති උප ලෙජරයේ අදාළ ගිණුම් හා ශේෂ ලැයිස්තුව

ClassWork.LK

(06) උප ලෙජරය පවත්වා ගැනීමේ ප්‍රයෝජන හතරක් දක්වන්න.

(07) විශාල පරිමාණයේ ව්‍යාපාරයක ණයගැති හා ණයහිමි උප ලෙජරයක් නොතබුණහොත් මතුවන ගැටලු මොනවාද?

(08) එක් එක් ගනුදෙනු හා බැඳුණු මූලික ලියවිලි හා මූලික සටහන් පොත් ණයහිමියන් හා සම්බන්ධ ගනුදෙනු ආශ්‍රයෙන් දක්වන්න.

මේ සඳහා පහත ආකෘතිය භාවිත කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලියවිල්ල | මූලික පොත |
|---|---|---|
| 1. ආරම්භක ශේෂයන් | ජර්නල් වවුචරය | පොදු ජර්නලය |
| 2. ණයට ගැනුම් | ............................................ | ............................................ |
| 3. ............................................ | ............................................ | ............................................ |
| 4. ............................................ | ............................................ | ............................................ |
| 5. ............................................ | ............................................ | ............................................ |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura